**වැලිගම නගර සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**-------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට වැලිගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම පිළිවෙලින් රු.4,700,000 ක් අඩුවෙන් හා රු.1,185,991 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ලැබිය යුතු රු.185,599 ක් වූ උසාවි දඩ හා රු.502,260 ක් වූ කසල බදු ආදායම අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාළව වැටුප් රහිත නිවාඩු සඳහා අයවිය යුතු රු.2,145,791 ක මුදල ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාළව රු. 863,675 ක වැටුප් රහිත නිවාඩු සඳහා අය කළ මුදල, සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතන වියදමින් අඩු කර තිබුණි.

(ඉ) ගෙවිය යුතු රු. 8,555,176 ක් වූ විශ්‍රාම වැටුප් දායකය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඊ) සංචාරක හෝටල් වෙනුවෙන් ලැබිය යුතු රු. 245,280 ක් වූ බලපත්‍ර ගාස්තු ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

----------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂ හා උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, අසමානතාවල එකතුව රු. 5,449,055 ක් පවතින බව නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ලැබිය යුතු ගිණුම්

-------------------

(i) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.39,689,972 ක් වූ ආදායම් ණයගැති ශේෂය තුළ වර්ෂ 03 ක කාලය ඉක්ම වූ එකතුව රු.1,464,647ක ශේෂ 04 ක් ඇතුළත් වී තිබුණි.

(ii) නිරවුල් කිරීමට පියවර නොගෙන මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.3,467,440 ක් වූ ශේෂ 10 ක් ඇතුළත් වී තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.18,824,991 ක් වූ අතර එම ශේෂ තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.2,817,380 ක් වූ ශේෂ 14 ක් ඇතුළත් වී තිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

----------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.130,062,204 ක් වූ ගිණුම් විෂයයන් 12 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.5 අනුකූල නොවීම්**

-----------------

**1.3.5.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) නගර සහා ආඥා පනතේ (255 අධිකාරය) 164(2) වගන්තිය | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල්, ආපනශාලා සහ නවාතැන් පොළවල වාර්ෂික ආදායමෙන් සියයට 1 ක බදු මුදලක් අයකල යුතු වුවද, බල ප්‍රදේශයේ ලියාපදිංචි හෝටල් 04 කින් ගාස්තු අයකර නොතිබුණි. බදුකුලී අයකිරීම්ද විධිමත් ගිණුම් වාර්තා මත සිදුකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය. | |
| (i) vi පරිච්ඡේදයේ 2.6 ඡේදය. | අනියම්/ ආදේශක සේවකයන්, කම්කරුවන් වෙනුවෙන් චර්යා සටහන් පවත්වා නොතිබුණි. |
| (ii) xii පරිච්ඡේදයේ 22.4 ඡේදය. | සභාවේ සේවකයන්ගේ වැටුප් රහිත නිවාඩු වාර්තා මාස්පතා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756, 757 | එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බඩු ලේඛණ පොත තුලනය කර බඩු ලේඛණ පොතෙහි දැක්වෙන ශේෂය සමඟ භෞතිකව ඇති ශේෂය නිවැරදිදැයි පරීක්ෂා කළ යුතු වුවද, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි.2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතුව පැවති එකතුව රු.1,479,842 ක් වූ පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.26,440,297 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.24,434,609 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

----------------------

### 2.2.1 ඇස්තමේන්තු ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැ 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැ 31 දිනට මුළු හිඟය |
| වරිපනම් හා බදු | 10,050,000 | 10,588,176 | 9,284,411 | 7,089,244 | 19,800,000 | 6,466,613 | 8,973,523 | 5,785,479 |
| කුලී | 15,897,200 | 12,809,606 | 11,178,912 | 5,426,584 | 12,665,000 | 990,952 | 11,392,601 | 3,795,890 |
| බලපත්‍ර ගස්තු | 3,326,500 | 4,453,836 | 4,453,836 | 336,459 | 1,603,000 | 2,391,421 | 3,260,307 | 336,459 |
| වෙනත් ආදායම් * | 45,456,000 | 30,435,604 | 25,102,453 | 27,419,003 | 49,946,000 | 27,569,287 | 8,481,935 | 22,085,852 |
| එකතුව | 74,729,700 | 58,287,222 | 50,019,612 | 40,271,290 | 84,014,000 | 37,418,273 | 32,108,366 | 32,003,680 |

***වෙනත් ආදායම් යටතේ සේවා සඳහා ගාස්තු,වරෙන්තු ගාස්තු හා දඩ , සහ මුද්දර ගාස්තු ද ඇතුළත්ව ඇත.**

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

**------------------------------------**

සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත කළ මුළු ආදායම රු.74,729,700 ක් වූ අතර බිල් කල ආදායම රු. 58,287,222 ක් විය. රු. 32,003,680 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.90,290,902 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු. 50,019,612 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.40,271,290 ක් වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

-----------------

(අ) **වරිපනම්**

----------

ආරම්භක හිඟ වරිපනම් බදු ශේෂය රු.5,459,835 ක් වූ අතර රු.7,215,544 ක් වූ බිල් කිරිම් සමඟ අයවිය යුතු මුළු මුදල රු.12,675,379 විය. ආරම්භක හිඟයෙන් සහ බිල් කිරිම්වලින් වර්ෂය තුළ මුළු අයවීම් රු.5,932,102 ක් වීම නිසා වර්ෂය අවසානයට හිඟය රු.6,743,277 ක් ඉහළ අගයක් ගෙන තිබුණි

(ආ) කසළ බදු

------------

කසළ බදු අය කිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබුණි.

(ඇ) විනෝද බදු

------------

ආරම්භක හිඟ විනෝදබදු ශේෂය රු.325,643 ක් වූ අතර රු.296,011 ක් වූ බිල් කිරිම් සමඟ අයවිය යුතු මුළු මුදල රු.621,654 ක් විය. හිඟ ශේෂයෙන් රු.45,000 ක් හා බිල් කිරීම්වලින් රු.230,689 ක් අයවී තිබූ අතර වර්ෂ අවසාන හිඟය රු. 345,965 ක් විය.

**2.2.4 කුලී**

-----

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ආරම්භක හිඟ ශේෂය රු.3,795,890 ක් වූ අතර බිල් කිරීම් රු.12,809,606 ක් සමඟ අයවිය යුතු මුළු මුදල 16,605,496 ක් විය. බිල් කිරීම්වලින් රු.10,048,613ක් හා හිඟ ශේෂයෙන් රු.1,130,299 පමණක් අයවී තිබීම නිසා වර්ෂය අවසානයට මුළු හිඟය රු.5,426,584 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) කඩ කාමර කුලී අය කිරීමට අදාළ දපපා/පපාකො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දනැති චක්‍රලේඛය ප්‍රකාර, කඩ කාමර 82 ක අවසන්වරට තක්සේරු කල දිනය සොයාගත නොහැකි අතර, තවත් කඩ කාමර 57 ක් 2012 වර්ෂයෙන් පසු කඩ කුලී තක්සේරු කර නොතිබුණි. ගිවිසුම් කාලය ඉකුත්ව තිබූ කඩ කාමර 53 න් රු.3,241,693 ක් අයවිමට තිබුණි.

(ඈ) සභාව විසින් 2017 වර්ෂය සඳහා කප්පරතොට මාළු වෙළඳසැල රු.2,455,000 ට ටෙන්ඩර් ලබාදී තිබුණද, ගිවිසුම අත්සන් කර නොතිබූ බැවින් වර්ෂය අවසානයට රු.1,253,683 ක හිඟ ආදායම අයකර ගැනීමේ අවදානමක් පැවතුණි. 2015 වර්ෂය වෙනුවෙන්ද එම ටෙන්ඩර්කරුගෙන් රු.180,850 සභාවට අයවීමට තිබුණි.

(ඉ) ගල්බොක්ක ගවමස්හල පෙර වර්ෂ 03 ක් සඳහා බදු දීම වෙනුවෙන් අයකල යුතු රු.408,198 ක මුදලක් හිඟව පැවතුණි.

**2.2.5 බලපත්‍ර ගාස්තු**

---------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) බලපත්‍ර ගාස්තු වෙනුවෙන් රු.336,459 ක් වූ ආරම්භක හිඟ ශේෂයක් පැවැති අතර, වර්ෂයේ බිල් කිරීම් සමඟ අයවිය යුතු මුළු මුදල රු.3,790,295 ක් විය. පැවති ආරම්භක හිඟ ශේෂයෙන් කිසිදු මුදලක් අයවී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා මාර්ග 03 කට අදාළව දැන්වීම් පුවරු 125 කින් රු.348,667 ක මුදලක් අයකර නොතිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.23,000 ක් හා මුද්දර ගාස්තු රු.26,483,120 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කාර්යසාධනය**

---------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය , පහසුව සහ සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණ කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

----------------

නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරනා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ අතර, 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා පහක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

පිළියෙළ කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු සංවර්ධන ව්‍යාපෘතිවලට අනුකූලව අයවැය ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි.

**(ඇ) අපේක්ෂිත නිමවුම් මට්ටම (output) ලබා නොගැනීම**

විවිධ කර්තව්‍යයන් 06 ක් ඉටු කිරීම සඳහා රු. 20,397,421ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම (output) අත්පත් කරගෙන නොතිබුණු අවස්ථා පහත දැක්වේ.

| **කර්තව්‍ය** | **ඇස්තමේන්තුගත මුදල** | **ඉටු කළ ප්‍රමාණයේ වටිනාකම** | **නිරීක්ෂණ** |
|---|---|---|---|
| | රු. | රු. | |
| පොදු පරිපාලනය | 275,000 | 125,783 | අපේක්ෂිත මට්ටම නිම කර නැත. |
| සෞඛ්‍ය සේවා | 2,921,000 | 275,416 | අපේක්ෂිත මට්ටම නිම කර නැත. |
| භෞතික සැලසුම් මංමාවත් හා ඉඩම් | 22,454,000 | 19,729,541 | අපේක්ෂිත මට්ටම නිම කර නැත. |
| කොම්පෝස්ට් හා රන්පොහොණිය | 1,157,000 | 9,850 | අපේක්ෂිත මට්ටමට නිම කර නැත. |
| මහජන උපයෝගීතා සේවා | 1,002,000 | - | ක්‍රියාත්මක කර නැත. |
| සුභසාධන සේවා | 44,511,000 | 256,831 | අපේක්ෂිත මට්ටමට නිම කර නැත. |
| | 72,320,000 | 20,397,421= | |

**(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

කසළ කළමනාකරණය වෙනුවෙන් කසළ එකතු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ සේවකයින් 91 දෙනෙකුගේ වැටුප්, වාහන හා ඉන්ධන වෙනුවෙන් රු.34,291,810 ක් ගෙවා තිබුණි. කාබනික පොහොර නිෂ්පාදනය සඳහා සේවකයන් 29 දෙනෙක් යොදවා ගෙන ඔවුන් සඳහා වැටුප් ලෙස රු.10,486,796 ක් ගෙවා තිබුණි. එකතු කරනු ලද දිරන කසළවලින් කාබනික පොහොර නිෂ්පාදනය සියයට 3.4 ක් පමණක් වී තිබූ අතර අලෙවි ආදායම රු.1,670,720 ක් විය. නොදිරන කසළ කාබනික පොහොර මධ්‍යස්ථානය අසළ අවිධිමත්ව බැහැර කර තිබූ අතර මේ සඳහා ලබාගත් පරිසර බලපත්‍රය 2016 අප්‍රේල් 20 දිනෙන් අවලංගු වී තිබුණි.

(ඉ) **තිරසර සංවර්ධන ඉලක්ක**

------------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

සේවකයින් 31 දෙනෙකුගෙන් 2016 හා 2017 වර්ෂවලට අදාළව වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට රු.2,145,791 ක මුදලක් අයවීමට තිබූ අතර, එම මුදලින් 2018 මැයි 18 දින වනවිට රු.937,612 ක් අයකරගෙන නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

අනුමත කාර්යමණ්ඩලයේ තනතුරු 16 ක පුරප්පාඩු හා තනතුරු 15 ක අතිරික්තයක් විය. භාණ්ඩාගාර ලේකම්ගේ 03/2014 සහ 25/2014 චක්‍රලේඛවල විධිවිධාන වලට පරිබාහිරව සේවකයන් 04 දෙනෙක් බඳවාගෙන 2015 සැප්තැම්බර් 01 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය තෙක් රු.2,945,623 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි. මීට අමකරව සභාව විසින් 2012 සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ කිසිඳු පත්වීම් ලිපියක් ලබා නොදී සේවයේ යොදවා ගෙන තිබූ සේවකයන් 07 දෙනෙකු සඳහා 2017 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් ලෙස රු.7,657,486 ක මුදලක් ගෙවා තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

----------------------------

**නිශ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

සභාව සතුව පැවති රු.293,000 ක් වටිනා අත් ට්‍රැක්ටර් 04 ක් වර්ෂ 03 කට වැඩි කාලයක සිට අළුත්වැඩියා කර ධාවනයට යොදවා ගැනිමට හෝ අපහරණය කිරිමට කටයුතු කර නොතිබුණු අතර රු. 20,826,010 ක් වටිනා වාහන 06 ක් ඌන උපයෝජිතව පැවතුණි.

## 3.5 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

සමාලෝචිත වර්ෂයේ කොම්පෝස්ට් හා රන් පොහොණිය අලෙවිසැලේ මුළු ආදායම රු.9,191,535 ක් වූ අතර මෙම වැඩ සටහන සඳහා වැටුප් හා දීමනා සහ අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා රු.21,958,457 ක් වියදම් කර තිබුණි. රන් පොහොණිය අලෙවි මධ්‍යස්ථානය සඳහා මිලදී ගෙන ඉවත දමන පළතුරු මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදුවී නොතිබූ අතර, 2018 මැයි 18 දින ස්ථානීය පරික්ෂාවේදී ඉවත් කරන පළතුරු කොටස් ලීටර් 4 ප්‍රමාණයේ අයිස්ක්‍රීම් බඳුන් 59 ක පුරවා අධිශීතකරණයේ ගබඩා කර තිබුණි. පළතුරු බඳුන් අවිධිමත් ලෙස ගබඩාකර තිබුණි.

**3.6 ප්‍රසම්පාදනය**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණු අතර වර්ෂය තුළ කර්මාන්ත සහ භාණ්ඩ හා සේවා සැපයීම සඳහා රු.31,876,097 ක් වියදම් කර තිබුණි.

**3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය**

සභාව විසින් කර්මාන්ත 06 ක් සඳහා වර්ගමීටර් 836,375 ක අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ඇල්ලීම වෙනුවෙන් අනුමත මිල ගණන් ඉක්මවමින් රු.295,240 ක මුදලක් ගෙවා තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 08 ක ඉතිරිය රු.86,963,768 ක් වූ අතර එම වටිනාකම් සියයට 2 සිට සියයට 69.4 දක්වා පරාසයක පැවතුණි.

(ආ) ආදායම් විෂයයන් 06 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.76,048,770 ක් වූ අතර, එම වටිනාකම් සියයට 4.1 සිට සියයට 80.2 දක්වා පරාසයක පැවතුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 රෙගුලාසි සහ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා තිබුණද 2017 වර්ෂය සඳහා කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

**5.** **පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ආදායම් රැස්කිරීම

(ඇ) අයවැය පාලනය

(ඈ) වියදම් පාලනය

(ඉ) ගබඩා පාලනය

(ඊ) ගිණුම්කරණය